**ශ්‍රී ලංකා රග්බි ආයතනය - 2021**
**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1. තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

ශ්‍රී ලංකා රග්බි ආයතනයේ ("ශ්‍රී ලංකා රග්බි ආයතනය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා රග්බි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර.) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා රග්බි ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා රග්බි ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා රග්බි ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා රග්බි ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා රග්බි ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා රග්බි ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ශ්‍රී ලංකා රග්බි ආයතනයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පලාත් ක්‍රීඩා සංගම් 5 ක් වෙත 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ක්‍රීඩා සංවර්ධන කටයුතු සඳහා ලබා දුන් රු. මිලියන 3.3ක් වූ අත්තිකාරම් වැය කිරීම් වලට අදාළ 2016 සිට 2019 වර්ෂ දක්වා වූ බිල්පත් ගෙවීම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දක්වා තිබුණි. | අත්තිකාරම් නොපිය වූ පළාත් සංගම් සඳහා ඉදිරියේදී මුදල් ලබා දීමේදී එය සලකා බලමි. | බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතු මුදල් වරින් වර පියවීමට කඩිනමින් පියවර ගත යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| අයිතමය | මුදල රු. මිලියන | ලබාදී නොමැති සාක්ෂිය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ගෙවිය යුතු ගිණුම් | 15.3 | ශේෂය තහවුරු කිරීම | ඉදිරියේදී නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | බැරකම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.6. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

#### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ලැබිය යුතු ගිණුම් වල ඇතුළත් වසර 05 ක කාලයක සිට පැවත එන ක්‍රීඩා සංවර්ධන කටයුතු සඳහා පලාත් සංගම් 02 ක් වෙත ලබා දුන් රු. **මිලියන** 1.2 ක් වූ අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ දී මෙම සියලුම අත්තිකාරම් මුදල් නිරවුල් කර ගැනීමට සංගමය කටයුතු කර ඇත. | අත්තිකාරම් මුදල් අප්‍රමාදව නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

#### 1.6.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂ 02 සිට 05 දක්වා කාල පරිච්ඡේදයක සිට පැවත එන රු. මිලියන 3.3ක් වූ ගිණුම් 51 ක් සහ හා සමාලෝචිත වර්ෂයට අදාළ රු. මිලියන 2.5ක් වූ අනිකුත් ගෙවීම් ශේෂ 08 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. රු. මිලියන 35ක් වූ වර්ෂයේ ආරම්භක ණය ශේෂයෙන් රු. මිලියන 3.1ක් පමණක් සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබුණු අතර රු. මිලියන 32.5ක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි. | එකඟ වේ. | බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතු මුදල් පියවීමට කඩිනමින් පියවර ගත යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා රග්බි ව්‍යවස්ථාවේ 14.1 (ඒ) සහ (ඔ) වගන්තිය | පළාත් රග්බි පාපන්දු සමාජ විසින් සෑම මුදල් වර්ෂයක්ම අවසන් වී දින 45 ක් ඇතුළත වරලත් ගණකාධිකාරිවරයෙකු විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවද පලාත් රග්බි පාපන්දු සමාජ 04 ක් මගින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබීම සම්බන්ධ ව්‍යවස්ථාපිත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සමග නො ලැබී ඇති පළාත් සංගම්වල මූල්‍ය ප්‍රකාශන අමුණා ඇත. | ශ්‍රී ලංකා රග්බි ව්‍යවස්ථාවට අනුව වරලත් ගණකාධිවරයකු විසින් සහතික කල මූල්‍ය වාර්ථා ඉදිරිපත් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.658,202 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 8,741,462 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 9,399,664 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වියදම් රු. 13,804,113 කින් අඩුවීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ජාත්‍යන්තර හා දේශීය ක්‍රීඩා විකාශනය සඳහා වර්ෂයකට රු. මිලියන 85ක අනුග්‍රාහක ගිවිසුමකට එළඹ තිබූ අතර 2021 වර්ෂය සඳහාද එම සමාගම රු. මිලියන 65ක අනුග්‍රාහක ගෙවීමක් කිරීමට එකඟ වී තිබියදී එම සමාගමට හෝ වෙනත් සමාගමකට අනුග්‍රාහක අයිතිය ලබා දීමට කටයුතු නොකිරීම නිසා අනුග්‍රාහක ආදායම් ආයතනයට අහිමි වී තිබුණි. | ඩයලොග් ආයතනය විකාශන අයිතිය නොමැතිව සංගමයේ අනුග්‍රහකත්වය ප්‍රතික්ෂේප කර ඇත. තවද ඩයලොග් ආයතනය සමග තිබූ ගිවිසුම මගින් රග්බි සංගමයට වෙනත් අනුග්‍රහකයකු ඇතුළු නොවීමට කොන්දේසි සකස් කර සියලුම ප්‍රචාරණ අයිතීන් එම සමාගම ඉල්ලා ඇත. එබැවින් සංගමයට වෙනත් අනුග්‍රහකයකු ලබාගැනීමේදී එය ගැටලුවක්ව පවතී. | සංගමය වෙත වඩාත් ඵලදායි මූල්‍ය කාර්ය සාධනයක් ලබා කර ගැනීමට අවශ්‍ය අනුග්‍රාහක ආදායම් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රග්බි වෙත සාමාජික මුදල් නොගෙවීම හේතුවෙන් බස්නාහිර සහ ඌව පළාත් රග්බි පාපන්දු සංගම්වල, සාමාජිකත්වය අහෝසි කළ යුතු බවට 2020 වර්ෂයේදී අභියාචනා උපදේශක කමිටුව විසින් නිර්දේශ කර තිබුණද එම නිර්දේශය ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | බස්නාහිර පළාත් සංගමය 2020 වර්ෂයට අදාළ සාමාජික ගාස්තු නොගෙවීම හේතුවෙන් සහ එසේම ඌව පළාත් සංගමය තරගාවලි සංවිධානය කර නොතිබීම හේතුවෙන් එම වර්ෂයට අදාළ අදාල ඡන්ද අයිතිය පමණක් අහෝසි වී ඇත. | සාමාජිකත්වය අහෝසි කරන ලද පළාත් රග්බි පාපන්දු සංගම් සම්බන්ධව සංගමයේ ව්‍යවස්ථාපිත නීති රීති ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |